# ප්‍රතිපත්ති ප්‍රකාශනය

අති ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ජනාධිපති

2000

6631

17 NOV 2000
පුස්තකාලය

# ප්‍රතිපත්ති ප්‍රකාශනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අතිගරු ජනාධිපතිනි
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය
2000 නොවැම්බර් මස 09 වෙනි දින
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අමතමින් ඉදිරිපත් කළ
ප්‍රතිපත්ති ප්‍රකාශය

ගරු කථානායකතුමනි,
ගරු මන්ත්‍රීවරුනි,

ශ්‍රී ලංකාවේ 11 වන පාර්ලිමේන්තුවේ නව සභා වාරය ආරම්භ වන්නේ අලුත් සිය වසට මුහුණ දීමට සැරසී සිටින අපේ ආදරණීය මව් බිමටත්, අපගේ ජනතාවටත් අතිශයින් වැදගත් වන ඓතිහාසිකවූත්, තීරණාත්මකවූත් මොහොතක යි. එහෙයින් ප්‍රථම කොට ම මේ ගරු සභාවට තේරී පත් වූ ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ සියලු ම මන්ත්‍රීතුමියන්ටත්, මන්ත්‍රීතුමන්ලාටත් මම මගේ උණුසුම් සුභ පැතුම් පිරිනමමි.

මේ ගරු සභාවේ අසුන්ගෙන සිටින ඔබ, අප කවර දේශපාලන පක්ෂයකට අයත් වුව ද අපගේ ප්‍රධාන වගකීම වන්නේ අප තෝරා පත් කළ සමස්ත ලාංකීක පොදු ජනතාවගේ සුබසෙත සැලසීම යි. එම වගකීමෙහි ප්‍රධාන පාර්ශ්වකරුවන් වන්නේ රාජ්‍ය නායිකාව ලෙස මමත්, මගේ ආණ්ඩුවත් බැව් අපි තේරුම් ගෙන සිටිමු. එහෙයින් මෙම වැදගත් අවස්ථාවේදී අප රජයේ ප්‍රතිපත්තිමය ඉදිරි දර්ශනය සහ 21 වන ශතවර්ෂයේ මුල් දස වසර සඳහා අපගේ ඉදිරි වැඩපිළිවෙල ඔබ හමුවේ පැහැදිලි කිරීමට මට අවසර දෙන්න.

ගරු කථානායකතුමනි,

පසුගිය ඔක්තෝබර් මස 10 වෙනි දා පැවැති මහා මැතිවරණයෙන් පොදුජන එක්සත් පෙරමුණ නැවත බලයට පත්වීම සුවිශේෂ සිදුවීමකි. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය දෙස ආපසු හැරී බැලුවහොත්, ආණ්ඩුවක් තම නිල කාලය අවසන්කර නියමිත කලට මැතිවරණ පවත්වා, බහුතර ජනතාවගේ වරමින් නැවත වරක්, එම ආණ්ඩුව ම තේරී පත්වූ ප්‍රථම අවස්ථාව මෙය බව ඔබට පෙනී යනවා

ඇත. එයින් ඉතා පැහැදිලි ව කියවෙන්නේ පසුගිය සය වසර තුළ මාගේ රජය විසින් මේ රටේ ජනතාව හමුවේ තබන ලද්දා වූ ප්‍රතිපත්තිමය ඉදිරි දර්ශනයත්, ක්‍රියාත්මක කරන ලද්දා වූ වැඩපිළිවෙලත් කෙරෙහි, බහුතර ජනතාව විශ්වාසය තබා ඇති බව යි. අපගේ ප්‍රතිපත්තිමය ඉදිරි දර්ශනයේ හා වැඩපිළිවෙලේ නිවැරදිභාවය ඔවුන් අනුමත කොට ඇත. මෙම මැතිවරණයේදී පමණක් නො ව, ඊට කලින් පැවැති මැතිවරණ ගණනාවකදී ද, මේ රටේ ජනතාව අපේ පක්ෂයට ජයග්‍රහණ අත්පත් කර දීමෙන් ඒ බව මොනවට පැහැදිලි වෙයි. එවැනි ජයග්‍රහණයක් අපට ලබාදීම ගැන මම මේ රටේ ජනතාවට ස්තුතිවන්ත වෙමි. සියලු ආකාරයේ ජාතිවාදය හා අන්තවාදය ඔවුන් පැහැදිලි ව ම ප්‍රතික්ෂේප කොට ඇත. මෙය අපේ අනාගතය පිළිබඳ සුභ පෙර නිමිත්තකි.

## අපේ ප්‍රතිපත්ති හා වැඩපිළිවෙල

1994 පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන විට අපි ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කළෙමු. එහිදී අපගේ දර්ශනය හා අප බලයට පත් වූ පසු ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ සංවර්ධන සැළසුම් ගැන විස්තරාත්මක ව සඳහන් කළෙමු. අනතුරු ව 1995 ජනවාරි 6 වෙනි දා පසුගිය පාර්ලිමේන්තුවේ සැසි වාරය විවෘත කරමින් එම ප්‍රතිපත්ති දීර්ඝ වශයෙන් ප්‍රකාශයට පත් කළෙමු.

පසුගිය හය වසර තුළ අප ක්‍රියාවට නැංවූ එම ප්‍රතිපත්ති වලින් සාර්ථක ප්‍රතිඵල ලැබී තිබේ. එම ප්‍රතිඵල අංශ දෙකකට බෙදිය හැකි ය. එක් අංශයක් දේශපාලන හා සමාජීය ක්ෂේත්‍රයේ ලබා ඇති ජයග්‍රහණ යි. ආර්ථික ක්ෂේත්‍රයේ ලැබූ ජයග්‍රහණ අනෙක් අංශය යි. බියෙන් සැකෙන් තොර ව ජීවත් වියහැකි සමාජයක් ගොඩනැගීම අප එදා දුන් පළමු පොරොන්දුව යි. අද එය ඉටුවී තිබේ. අද අපේ ජනතාවට මරණ බය නැත. අපේ රටේ තරුණ දූ පුතුන්ට බියෙන් සැකෙන් තොර ව නිදහසේ ජීවත්වීමේ පරිසරය දැන් උදා වී තිබේ. භීෂණයෙන් තොර නිදහස් රටක් බිහිකරන බවට අප දුන් පොරොන්දුව ඉටුකරන්නට හැකිවීම ගැන පොදුජන එක්සත් පෙරමුණු රජයත්, පෞද්ගලික ව මා තුළත් ඇත්තේ බලවත් සතුටකි.

ගෙවුනු හය වසරක කාලය තුළ අපේ රජය ගොඩනැගුවේ නව දේශපාලන සංස්කෘතියක් පමණක් නො වේ. ඊට ම ගැළපෙන නව ආර්ථික සංස්කෘතියක් ගොඩනැගීමට ද අපි පියවර ගත්තෙමු. ආර්ථික ක්ෂේත්‍රයේදී අපි අතීතයට ආයුබෝවන් කීවෙමු. අද ලෝක ආර්ථිකයේ ප්‍රධාන හා වැදගත් මධ්‍යස්ථාන සමග ශ්‍රී ලංකාව සම්බන්ධ වී සිටින බව ඔබ දන්නවා ඇත. අප ලබාගත් ආර්ථික ප්‍රගතිය පිළිබඳ තොරතුරු ස්වල්පයක් ඉදිරියේදී සඳහන් කිරීමට බලාපොරොත්තු වෙමි.

අපගේ සංවර්ධන සැළසුම් ක්‍රියාත්මක වන අතරතුරේ ම පසුගිය වසරේ අගෝස්තු 19 වෙනිදා "21 වන සියවසට නව දර්ශනයක්" යන ප්‍රකාශනයෙන් අපි අපේ ඉදිරි වැඩපිළිවෙල විස්තරාත්මක ව ඉදිරිපත් කළෙමු. වර්ෂ 2010 දක්වා රටේ ආර්ථික සංවර්ධන මූලෝපායයන් හා ක්‍රියාමාර්ග එහි අන්තර්ගත වෙයි. වර්තමානයේ අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන්නේ එය යි. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේ මැතිවරණ ප්‍රකාශනයට පදනම වූයේත් එය යි. අපේ අනාගත වැඩපිළිවෙල වන්නේත් එය යි.

එකී ඉදිරි දර්ශනය කෙරෙහි ජනතාව තැබූ විශ්වාසය හේතුවෙන් එම වැඩපිළිවෙල ඉදිරියටත් ගෙන යෑමට හැකිවන පරිදි සියලු ම පළාත් සභාවල මෙන් ම උතුරු නැගෙනහිර හැර දිස්ත්‍රික්ක 17 ක පළාත් පාලන ආයතන 236 න් 196 ක ද බලය මගේ රජයට ලැබී ඇත. රටේ දේශපාලන ස්ථාවරභාවය මැනැවින් තහවුරුවී ඇති බවට එය කදි ම සාධකයෙකි. දේශීය වශයෙන් මෙන් ම විදේශීය වශයෙන් ද එල්ල වූ විවිධ බාධක හා අභියෝග ජය ගනිමින්, පසුගිය සය වසර තුළ අප රටේ දේශපාලන ස්ථාවරභාවය තහවුරු වූ ආකාරය ජාත්‍යන්තර ප්‍රජාව තුළ ද ප්‍රශංසාවට ලක්වී ඇත.

ගරු කථානායකතුමනි,

එක් අතකින් ගත් කල රාජ්‍ය පාලනය යනු අභියෝග වලට මුහුණදීමේ ක්‍රියාදාමයකි. පුද්ගලික ව ගත්විට එය මට නුහුරුවූවක් නො වේ. එය මගේ ජීවිතය විසින් මට පසක් කරදී ඇත. අනෙක් අතට පොදුවේ රජයක් හැටියට පසුගිය සය වසර තුළ දැඩි අභියෝග වලට මුහුණදී

අප පන්නරය ලබා සිටිමු. එය දැන් නො බිඳෙන පන්නරයක් වී ඇත. රාජ්‍ය පාලනය තුළ අභියෝග යනු මැතිවරණ ජය ගැනීම පමණක් නො වේ. මැතිවරණ සටනේදී පක්ෂය තුළ මෙන් ම පක්ෂ අතර ඇතිවූ අර්බුදත් සමග, ලාංකීක ජන සමාජය තුළ තිබෙන්නා වූ අර්බුද වල බැරෑරුම්කම සසඳා බැලිය යුතු ව තිබේ. මැතිවරණ අභියෝග ජය ගැනීම සඳහා එක් එක් පක්ෂ අතර තිබූ එදිරිවාදිකම් පසෙක තබා, රට මුහුණපා ඇති සැබෑ අභියෝග දෙස බැරෑරුම් සහගත ව නෙත් සිත් යොමු කිරීමට දැන් ඔබ, අප සැමට අවස්ථාව උදා වී ඇති බව එවිට වැටහෙනවා ඇත. අපට මුහුණදීමට සිදුවී ඇති එම අභියෝග මොනවාද?

ගරු කථානායකතුමනි,

ඒවා ප්‍රධාන ශීර්ෂ තුනක් ඔස්සේ පෙළ ගැස්වීමට මම උත්සාහ දරන්නම්.

(1) සැම ක්ෂේත්‍රයක ම මූලික මිනිස් අයිතිවාසිකම් තවදුරටත් සහතික කරමින් රාජ්‍යයත්, සමාජයත් අඛණ්ඩ ප්‍රජාතන්ත්‍රීකරණයට ලක් කිරීම.

(2) යුද්ධය නිම කිරීම සහ ජාතික ගැටළුවට දේශපාලන විසඳුමක් නිර්මාණය කර ගැනීම.

(3) ස්ථිරසාර ආර්ථික ක්‍රියාදාමයක් තුළ දිළිඳුභාවය පිටුදැකීම තුළින් අප රට තුන්වෙනි ලෝකයේ සංවර්ධිත හා දියුණු ම රටක් බවට ගොඩ නැගීම.

ගරු කථානායකතුමනි,

ආර්ථික සංවර්ධනය, සමාජයේ ප්‍රජාතන්ත්‍රීකරණය සහ යුද්ධය නිමවා ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් සෙවීම යන මේ කාරණා තුන වෙන වෙන ම ගෙනහැර දැක්වුව ද ඇත්ත වශයෙන් ම ඒවා එක ම ප්‍රශ්නයක විවිධ පැතිකඩ ලෙස හැඳින්වීම වඩාත් නිවැරැදි ය. ආර්ථික සංවර්ධනයක් නැති තැන සමාජීය සමානතාවක් නැත. ජනවාර්ගික සමානතාවක් නැති තැන සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් ද නැත. එවැනි පසුබිමක් තුළ ඇතිවන අසාධාරණය, තුවක්කු, බෝම්බ වලට

පරිවර්තනය වීම නවීන ලෝකයේ විශේෂ ලක්ෂණයකි. අපේ රටේ ආර්ථික සංවර්ධනය පිළිබඳ කාරණයේදී මෙන් ම ජනවාර්ගික ගැටළුව පිළිබඳ කාරණයේදී ද යුද්ධය සම්බන්ධ ප්‍රශ්නය පළමු තැනට පත් වී ඇත. එබැවින්, අපි ආර්ථික සංවර්ධනය පිළිබඳ කාරණයෙන් පටන් ගනිමු.

## හය වසරක ස්ථිරසාර ආර්ථික සංවර්ධන ක්‍රියාදාමය

පොදු පෙරමුණු රජයේ මුල් අවුරුදු කිහිපයේ සකස් කරන ලද අපගේ සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවල අරමුණ වූයේ 1994 වනවිට මේ රටේ බිඳ වැටී තිබුණු ආර්ථිකය නැවත ගොඩ නැංවීම යි. එහි ප්‍රතිඵල දැන් ලැබෙමින් පවතී. දැවැන්ත යුද්ධයක් මධ්‍යයේ වුව ද ආර්ථික වර්ධන වේගය වසර හයක් තිස්සේ 5% ක මට්ටමක තබා ගැනීමට අපට හැකි විය. 1994 දී රුපියල් බිලියන 579 ක්වූ දළ දේශීය නිෂ්පාදනය 1999 වනවිට රුපියල් බිලියන 1,111 දක්වා වැඩි විය. 1994 දී 14.4% ක් ව තිබූ රැකියා වියුක්තිය 8% දක්වා අඩු වූ අතර 1994 රුපියල් 32,414 ක් වූ (ඇමරිකානු ඩොලර් 515 ක්වූ) ඒක පුද්ගල ආදායම 1999 වනවිට රුපියල් 58,323 ක් (ඇමරිකානු ඩොලර් 829 ක්)විය. රාජ්‍ය සේවක වැටුප් 80% කින් වැඩි වී ඇත. උද්ධමන වේගය 15% සිට 8% දක්වා අඩු විය. මෙහි තේරුම බඩු මිළ පාලනය කර ගැනීමට අපට හැකි වූ බව යි. පසුගිය වසර හය තුළ විදේශ වත්කම් සංචිතය ඩොලර් මිලියන 1,400 සිට 2,500 දක්වා වැඩි කර ගැනීමට අපි සමත් වුනෙමු. අප ලබාගත් තවත් ජයග්‍රහණයක් නම් දළ දේශීය නිෂ්පාදිතය වගේ ම ඉතිරි කිරීම් ප්‍රමාණයත් ඉහළ යෑම යි. වසර 2000 වනවිට 1994 17.8% ක් ව තිබූ අපගේ ඉතිරි කිරීම් 24% දක්වා ඉහළ ගොස් තිබුණි. එමෙන් ම අපනයන ආදායම් 50% කින් වැඩි වී ඇත. ඒ නිසා ම අවාසිදායක වෙළඳ පරතරය අඩු වී ඇත. මෙම ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් විදේශ ණය බර අඩු කර ගන්නට අපට හැකි විය. 1999 වනවිට විදේශ ණය 1994 මට්ටමේ සිට 57% දක්වා පහත වැටී තිබේ. ශක්තිමත් ආර්ථිකයක් සඳහා අප දැමූ මේ අඩිතාළම රටේ දේශීය, කාර්මික, කෘෂිකාර්මික සහ යටිතළ පහසුකම් ගොඩනැගීම ආදී අංශ ලබා ඇති ප්‍රගතියෙන් පැහැදිළි ය.

1994 දී ග්‍රාමීය ජනතාවට විදුලිය සැපයීම 36% ක් වූ අතර එය 1999 වනවිට 53% දක්වා වැඩි වී ඇත. දුරකථන ප්‍රමාණය 1994 ට වඩා හතර ගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි වී ඇත. එදා 80% ක් වූ ජලය මත රඳා පැවැති විදුලිය නිෂ්පාදනය අද 67% දක්වා අඩුකොට ඇත.

ගෙවුනු හය වසරක කාලය තුළ ජනතාවගේ පරිභෝජන රටාවේ විශාල වෙනස්කම් සිදු විය. ජන ජීවිතයට අත්‍යවශ්‍ය හාල්, වී, තිරිඟු පිටි, මත්ස්‍ය හා මාංශ පරිභෝජණය විශාල වශයෙන් වැඩි විය. ත්‍රී රෝද රථ භාවිතය, ගෑස් පරිභෝජනය, මෝටර් සයිකල්, රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර භාවිතය ද කැපී පෙනෙන අයුරින් වැඩි විය. උදාහරණ කිහිපයක් ගෙනහැර දැක්වුවහොත් 1994 දී 15,000 ක් පමණ වූ ත්‍රී රෝද රථ සංඛ්‍යාව 99 දී 1,20,000 දක්වා වැඩි විය. වී නිෂ්පාදනය වැඩිවීම 45% කි. තේ කර්මාන්තයේ වැඩිවීම 80% ක් වන අතර ධීවර කර්මාන්තයේ නිෂ්පාදන වැඩිවීම 85% ක් වෙයි. කර්මාන්ත නිෂ්පාදනය දෙගුණයක් වී ඇති අතර ඉතිරි කිරීම් ද දෙගුණ වී තිබේ.

ස්ථිරසාර ආර්ථික සංවර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය සාධක වන්නේ සාර්ව ආර්ථික හා මූල්‍ය ස්ථාවරත්වය, අඩු උද්ධමනය තුළින් ජීවන වියදම් මිළ වැඩිවීම අවම කිරීම, අයවැය පරතරය අඩුවීම, ශක්තිමත් ගෙවුම් ශේෂය සහ ආදායම් සාධාරණ ලෙස බෙදී යාම යි. ආර්ථික කළමනාකරණය මේ අරමුණු ඔස්සේ ගෙන යමින්, අපේ ආර්ථික ජයග්‍රහණ තවදුරටත් ශක්තිමත් කිරීමට අපි දිගට ම ක්‍රියා කරගෙන යන්නෙමු. සමාජයේ ප්‍රජාතන්ත්‍රීකරණය හා යුද්ධය පිළිබඳ කාරණය ගැන කතා කරන්නට කලින් අපේ ඉදිරි දර්ශනය ගැනත් මේ අවස්ථාවේදී ම කරුණු ස්වල්පයක් ඔබේ අවධානයට ලක් කිරීමට මට අවසර දෙන්න.

## ඉදිරි වැඩපිළිවෙල

ගරු කථානායකතුමනි,

අපේ අනාගත වැඩපිළිවෙල පිළිබඳ පුංචි ඉඟියක් අපේ මැතිවරණ ප්‍රකාශනයට ඇතුළත් කොට ඇත. එම මැතිවරණ ප්‍රකාශනය අන් කිසිවක් නොවෙයි, මා මුලින් ද සඳහන් කළ පරිදි 1999 අගෝස්තු

මාසයේ අප රටට ඉදිරිපත් කළ "21 වන සියවස සඳහා වූ අපේ නව දර්ශනයයි". මෙහි අඩංගු ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම සඳහා මැදි කාලීන හා දිගු කාලීන සැළසුම් දෙකක් අප සතු ව ඇත. මැදි කාලීන සංවර්ධන උපාය මාර්ගය වසර 2000 සිට 2005 දක්වා යි. මෙහි මූලික අරමුණ දේශීය ඉතිරි කිරීම් ඉහළ නැංවීම, අයවැය හිඟය පාලනය කිරීම සහ දේශීය ණය ගැනීම් අඩුකිරීම තුළින් ආයෝජනය සඳහා පෞද්ගලික අංශයට සම්පත් මුදා හැරීම, දිළිඳු බව තුරන් කිරීම, විරැකියාව තවදුරටත් පහත හෙළීම හා ජීවන වියදම අඩු කිරීම යි.

මේ අනුව දැනට 4% සිට 5% දක්වා වන වාර්ෂික වර්ධන වේගය ඉදිරි අවුරුදු කිහිපය තුළ 8% දක්වා මට්ටමකට ගෙන ඒම අපගේ ඉලක්කය යි. එසේ වුවහොත් විරැකියාව 4% දක්වා අඩු කරගත හැකි ය. ඒ අනුව රැකියා ප්‍රශ්නය සම්පූර්ණයෙන් ම වාගේ විසඳෙයි. එහෙත් දිළිඳුකම තුරන් කිරීමේ වැඩපිළිවෙල සාර්ථක කර ගැනීමට නම්, ජීවන වියදම ඉහළ යෑමේ වේගය 3% - 4% මට්ටම දක්වා පහත හෙළිය යුතු යි. මේ අරමුණ ඉටු කර ගැනීමට නම් දැනට 8% මට්ටමේ පවත්නා අයවැය හිඟය වසර 2003 වනවිට 5% දක්වා අඩු කර ගැනීම අවශ්‍ය වෙයි. ජාතික ඉතිරි කිරීම් ප්‍රතිශතය 2010 වනවිට 35% දක්වා වැඩි කර ගැනීම ද අවශ්‍ය වන්නේ ය.

මේ සමගම මුදුන් පමුණුවා ගතයුතු ආර්ථික, සංවර්ධන හා සාමාජික ඉලක්ක ගණනාවක් ද තිබෙන බව පෙන්වා දෙන්නට මා කැමැතියි. අපගේ ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රධාන ඉලක්ක තුනකි. ඉන් පළමුවැන්න, විවිධ වූ ආර්ථික සංවර්ධනය යි. මෙහි දී ප්‍රධාන අවධානය යොමු වන්නේ යටිතළ පහසුකම් ඉක්මනින් වැඩි දියුණු කිරීම කෙරෙහි ය. දෙ වන කාරණය යටිතළ පහසුකම් වැඩි දියුණු කිරීම මගින් නිෂ්පාදනය තව තවත් නංවාලීම යි. පුද්ගල ආදායම් වැඩි කිරීම මගින් දිළිඳුභාවය නැති කොට ඒක පුද්ගල ආදායම් ව්‍යාප්තියේ විෂමතා අවම කිරීම තුන්වන කාරණය වන්නේ ය. ප්‍රධාන යටිතළ පහසුකම් හඳුනාගැනීමේ වැඩපිළිවෙල යටතේ ශ්‍රී ලංකාව දකුණු හා අග්නිදිග ආසියාවේ ප්‍රධාන මූල්‍යමය හා සේවා මධ්‍යස්ථානය බවට පත් කිරීම අපගේ ඉලක්කය යි. මහා මාර්ග, විදුලිය, දුරකථන, විද්‍යුත් තාක්ෂණය, ජල සැපයීම, බැංකු සහ කාර්යක්ෂම රාජ්‍ය අංශයක්

කෙරෙහි අප විශේෂ අවධානය යොමු කොට ඇත්තේ මේ නිසා ය. මේ වැඩපිළිවෙල අනුව කොළඹ-කටුනායක, මහනුවර-ගාල්ල හා මාතර ඒකාබද්ධ කරන නව අධිවේගී මහා මාර්ග වසර 2005 වනවිට නිම කර ගැනීම අපේ ඉලක්කය යි. වසර 2010 වනවිට රටේ සමස්ත ප්‍රවාහන පද්ධතිය ම නවීකරණය කළ යුතු යි. ජනතාවට පානීය ජලය, විදුලි බලය හා නිවාස සැපයීමේ වැඩපිළිවෙල වසර 2010 වනවිට සම්පූර්ණ කළයුතු අතර, දිවයිනේ ප්‍රවාහන පහසුකම් හා පණිවුඩ හුවමාරු සම්බන්ධතා ද මේ වනවිට සම්පූර්ණ කළ යුතු ව තිබේ. රටේ අධ්‍යාපන අංශය කෙරෙහි විශේෂ අවධානය යොමු කරන අපි, සෑම මැතිවරණ කොට්ඨාශයක ම අංග සම්පූර්ණ පාසැල් තුන බැගින් පිහිටුවීමට සැළසුම් කොට ඇත්තෙමු. විද්‍යාව, තාක්ෂණය හා විදේශ භාෂා ඉගැන්වීම සඳහා විශේෂ පහසුකම් සැළසේ. ඉදිරි අවුරුදු තුන තුළදී ශ්‍රී ලංකාව දකුණු ආසියාතු කලාපයේ "පරිඝණක දිවයින" බවට පත් කිරීම අරමුණු කර ගනිමින්, අපි ඒ සඳහා නව අමාත්‍යාංශයක් ද පිහිටුවා ඇත්තෙමු.

උසස් අධ්‍යාපනය නොලබන අය සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම, සෑම දිස්ත්‍රික්කයක ම අංග සම්පූර්ණ ප්‍රධාන රෝහලක් පිහිටුවීම හා ග්‍රාමීය රෝහල් වැඩි දියුණු කිරීම, වතුකරයේ 75% කට අවශ්‍ය නිවාස, පානීය ජලය, විදුලි බලය, පාසැල් හා සෞඛ්‍ය පහසුකම් ලබාදීම අපේ ඉදිරි වැඩපිළිවෙලේ ඉලක්ක යි. වරාය සංවර්ධනය පිළිබඳ අපේ ජාතික ප්‍රතිපත්තියට අනුකූල ව වරාය හා ඊට අදාළ කටයුතු සංවර්ධනය කිරීමට පියවර ගනිමින් පවතී. සිංගප්පූරුවේ, හොංකොං හා ඩුබායිහි තිබෙන වරාය වලට සමාන වූ දියුණු වරාය අප රටේ ද ඉදි කරනු ඇත. කොළඹ වරාය පුළුල් කිරීම, ගාල්ලේ නව වරාය දියුණු කිරීම සහ හම්බන්තොට හා ඔළුවිල්හි වරාය ඉදි කිරීම ද අපගේ වැඩපිළිවෙලට අයත් ය. අමාත්‍යාංශ වැඩි ගණනකින් සමන්විත මාගේ නව අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වන්නේ අපගේ මේ ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ශීඝ්‍රයෙන් සම්පාදනය කිරීම යි. ඔක්තෝබර් 10 වෙනි දා පැවැති මැතිවරණ ප්‍රතිඵලය තුලින් ඉස්මතු කොට ඇති මේ රටේ ගොවි ජනතාවගේ ප්‍රශ්නය කෙරෙහි ද, අපි විශේෂ අවධානය යොමු කරන්නෙමු.

කෘෂි බෝග අලෙවිය හා බෙදා හැරීම සඳහා වෙන ම අධිකාරියක් පිහිටුවනු ලැබේ. විශේෂයෙන් ම වී, අල, ලූණු, එළවළු බෝග හා පළතුරු වගා කිරීම හා නිෂ්පාදන අලෙවි කිරීම පිළිබඳ ව විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරෙනු ඇත. වී ගොවිතැනින් අපි ස්වයංපෝෂිත තත්ත්වයකට ළංවෙමින් සිටිමු. එවැනි අවස්ථාවක කාලීන වශයෙන් ඇතිවන අතිරික්තයන් නිසා දේශීය වෙළඳ පොළෙහි මිල උච්චාවචනයන්ට ගොදුරුවෙයි. මීට පිළියම් වශයෙන් නිෂ්පාදන අතිරික්තයන් අපනයනය කර දේශීය වෙළඳ පොළ මිල ස්ථාවර තත්ත්වයක තබා ගැනීමටත් කටයුතු කිරීමට බලාපොරොත්තුවෙමු.

යම් යම් අවස්ථාවල ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම හේතුකොට ගෙන දේශීය ගොවියාට මුහුණ පෑමට සිදුවන අහිතකර බලපෑම ඉවත් කිරීම සඳහා පසුගිය වසර හය තුළදී ක්‍රියාත්මක කරන ලද ආරක්ෂණ වැඩසටහන් ක්‍රමානුකූල ව දියත් කිරීමට පියවර ගන්නෙමු.

ඇතැම් ව්‍යාපාරිකයින්ට ඒකාධිකාරී වරම් හිමිවීම නිසා පාරිභෝගිකයා දුෂ්කරතාවන්ට පත්වන අවස්ථා එමට ඇති වේ. මෙවැනි ඒකාධිකාර බිඳ හෙළීමට අපි පියවර ගන්නෙමු.

කාර්මික හා කෘෂිකාර්මික යන අංශ කෙරෙහි නව ආයෝජකයින් දිරි ගැන්වීම සඳහා පසුගිය වසර හය තුළ රජයේ අවධානය යොමු කළ අතර, ඒ සම්බන්ධයෙන් විශාල වැඩ කොටසක් කළත්, තවමත් ව්‍යාපාරිකයින්ට බැංකුවලින් ණය ගැනීම හා ඉඩම් ලබා ගැනීම් වැනි කටයුතුවලදී යම් යම් බාධාවන්ට මුහුණ දීමට සිදු වී ඇති බව පෙනී යගාස් ඇත. මේ සම්බන්ධයෙන් රජය මැදිහත්වීමට අදහස් කරයි.

වසර 2010 වනවිට මත් ද්‍රව්‍ය, මත් පැන් සහ දුම්පානය ඇතුළු සමාජ අපචාර 50% කින් අඩු කිරීම අපගේ ඉලක්කය යි. වයස්ගත පුද්ගලයින් සඳහා සෑම දිස්ත්‍රික්කයක ම වැඩිහිටි නිවාස ආරම්භ කෙරේ. ඔවුන්ට මනා සෞඛ්‍ය පහසුකම් මෙන් ම සිය ජීවිතයේ සැඳෑ සමය එලදායී ලෙස විවේකී ව ගත කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දෙනු ලැබේ. රණවිරුවන්ට, යුද්ධයෙන් ආබාධිතවූවන්ට දැනට වඩා වැඩි පහසුකම් සැලසේ. පසුගිය අයවැය කතාවේදී සඳහන් කළ පරිදි ගොවීන්, ධීවර

කාර්මිකයින්, වතු කම්කරුවන්, රජයේ සේවකයින්, තරුණයින්, මාධ්‍යවේදීන්, කලාකරුවන්, ස්වයං රැකියාවල නිරතවූවන්, කාන්තාවන් හා දරුවන්ගේ සුභසාධනය සඳහා විශේෂ වැඩසටහන් සාර්ථක ලෙස ක්‍රියා කිරීමට අපි සැලසුම් සකස් කොට ඇත්තෙමු.

## ගෝලීයකරණ අභියෝගය

ගරු කථානායකතුමනි,

ගෝලීයකරණය යනුවෙන් අද සුලභ ව භාවිතා කෙරෙන සංකල්පය "වෙළඳපොළ ආර්ථිකය රාජ්‍ය සීමා ඉක්මවා ව්‍යාප්තවීම" නැමැති ආර්ථික සංකල්පයට පමණක් ලඝු කිරීමට මම අදහස් නො කරමි. ගෝලීයකරණය ලෝකයේ සංස්කෘතික, සාමාජික හා සන්නිවේදනය යන ක්ෂේත්‍ර වලට තදින් ම බලපා ඇත. ගෝලීයකරණය ප්‍රබුද්ධ සංකල්පයකි. එහෙත් එයින් ලැබෙන අහිතවූ ප්‍රතිඵල ද ඇත. විශේෂයෙන් ම ගෝලීයකරණ ක්‍රියාදාමය නිසා සමාජ සංවර්ධන ක්‍රියාවලියේදී පසෙකට තල්ලු කරනු ලබන්නා වූ ජන කොටස් නගා සිටුවීම කෙරෙහි අපගේ අවධානය යොමුවිය යුතු ය. ගොවීන්, සුළු කර්මාන්තකරුවන්, රැකියා විරහිත තරුණ කොටස් මේ අතර ප්‍රධාන තැනක් ගනී. එසේම පොදුවේ ග්‍රාමීය හා නාගරික දිළිඳුභාවය පිටුදැකීමේ ප්‍රබල වැඩසටහනක් අපට අවශ්‍ය වන්නකි. මේ පිළිබඳ ව ගැඹුරින් සළකා බැලීමට පසුගිය මැතිවරණ ප්‍රතිඵලය ද අපට බල කර තිබේ. අප ආරම්භකර ක්‍රියාවට නැංවූ "සමෘද්ධි වැඩපිළිවෙළ" වඩාත් ව්‍යාප්ත කළ යුතු ව තිබෙන්නේ මේ පසුබිම තුළ ය.

ගරු කථානායකතුමනි,

අපේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වෙළඳ පොල ක්‍රමය සහ ආයෝජන දිරි ගැන්වීම මත පිහිටුවීමට අපට සිදු වී තිබේ. එහෙත් දිළිඳු රටක් වශයෙන් දිළිඳු ජන කොටස් සඳහා සමාජ ආරක්ෂණ ව්‍යාපෘති සහ සුභසාධන වැඩ කටයුතුවලටද ප්‍රමුඛත්වය ලබාදීම අපේ වැඩපිළිවෙලේ ප්‍රධාන අංගයක් වෙයි. දිවංගත එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමා අපගේ පක්ෂය ආරම්භ කළේ මේ රටේ බහුතරයක් වූ දුගී දුප්පත් ජනතාවගේ ආර්ථික, සමාජ, සංස්කෘතික

මට්ටම ඉහළට ඔසවා තැබීමට ය. එහෙයින් අපගේ දර්ශනය සකස් වී තිබෙන්නේ මේ සාධක තුන ම එකට එකතුකර දියුණුව කරා යන්නේ කෙසේ ද යන්න විමසා බලන්නාවූ මාවත් ඔස්සේ ය. නිදහස් වෙළඳ ආර්ථිකයක් තුළ ද දේපොළ හිමිකම් හා ප්‍රාග්ධනය රාශිභූතවීම තුළ ද සමාජයේ තව කොටසක් අන්ත දිළිඳුභාවයට පත්වීමට ඇති ඉඩකඩ වැළැක්වීම අප තරයේ අනුගමනය කරන ප්‍රතිපත්තියකි.

අද අපට අවශ්‍ය වී ඇත්තේ, වෙනස් වී ඇති ජාතික හා අන්තර්ජාතික දේශපාලන රටාවටත් 21 වන සියවසේ ගෝලීයකරණ සමාජයටත් ගැළපෙන ප්‍රබුද්ධ චින්තනයකින් යුත් දේශපාලන හා ආර්ථික පිළිවෙතකි. එම පිළිවෙත නිසැකයෙන් ම ධනේශ්වර ආර්ථික ක්‍රමයේ සුවිශේෂ වූ කළමනාකාර හැකියාව හා තාක්ෂණයත්, සමාජවාදී ආර්ථික ක්‍රමයේ මිනිස්කම හා සමාජ සාධාරණත්වයත්, ලෝව පිළිගත් නූතන නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන දර්ශනයේ සාරධර්මත් හරි හරියට සම්මිශ්‍රනය වූ වැඩපිළිවෙළක් විය යුතුය. ඒ සමග ම එය අපේ ජාතියේ අභිමානය, සංස්කෘතිය හා ප්‍රෞඪ බව ආරක්ෂා කර ගැනීමට ශක්තිය ඇත්තා වූ වැඩපිළිවෙළක් ද විය යුතු ය. අවසාන විග්‍රහයේදී එය සිංහල බෞද්ධ, සිංහල ක්‍රිස්තියානි අති බහුතරයේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතර ම, දමිළ, මුස්ලිම් හා බර්ගර් ඇතුළු සෙසු සියලු ජාතීන් හා ආගමිකයින් සමානාත්මතාවයෙන් සළකන, ඔවුන්ගේ අනන්‍යතාව පිළිගන්නා සමාජයක් නිර්මාණය කරන පිළිවෙතක් විය යුතු ය. වෙනත් වචන වලින් කියනවානම් මෙහි තේරුම මනුස්සකමට මුල් තැන දීම ය. අපේ රට උතුම් මිනිසුන්ට ජීවත් විය හැකි, මිනිස්කමින් පිරුණු උදාර දේශයක් බවට පත් කිරීම යි.

## සෑම ක්ෂේත්‍රයක ම මූලික මිනිස් අයිතිවාසිකම් ශක්තිමත් කරමින් සමාජය ප්‍රජාතාන්ත්‍රිකරණයට ලක් කිරීම

ගරු කථානායකතුමනි,

අප ඉදිරියේ ඇති අභියෝග තුනෙන් එකක් මම පැහැදිලි කළෙමි. ඉතිරි අභියෝග දෙක එනම් සමාජයේ ප්‍රජාතන්ත්‍රීකරණය සහ යුද්ධය නිමාකොට ජාතික ගැටළුවට දේශපාලන විසඳුමක් ලබා දෙමින් සාමය

උදා කරලීම යන කාරණා විමසා බැලිය යුත්තේ මා මුලින් විස්තර කළ අභියෝගයේ පසුබිම තුළ ය. එහිදී අප පසු කළ ඉතිහාසය දෙස මදක් ආපසු හැරී බැලිය යුත්තේ, අප ඉදිරියේ ඇති අභියෝග කුමක්දැයි නිසි පරිදි වටහාගනු සඳහා ය.

මානව සමාජයේ ඉතිහාසය ඉදිරියට ගියේ විවිධාකාර වූ යුග හා කාලවකවානු පසුකර ගෙනයි. අප රටට උරුම වූ දීර්ඝ ඉතිහාසයේ එවැනි යුග කිහිපයක් අපි පසු කළෙමු. මුලින් ම ශිෂ්ටාචාරයේ යුගය. ඉන්පසු යටත් විජිත යුගය. ඊළඟට පශ්චාත් යටත් විජිත යුගය. ඒ යුග පසුකළ අපි 1956 සිට 77 දක්වා පුනර්ජීවන යුගයට පා තැබුවෙමු. තවත් විදියකින් කියනවානම් පොදු ජනතාවගේ යුගයකට අපි පා තැබුවෙමු. අපේ රටේ ජනතාවට නිදහසේ අත පය දිග හරින්නට ඉඩ ලැබුණේ මේ කාලවකවානුවේදී ය. මෙය සමාජය ප්‍රතිනිර්මාණය කිරීමේ යුගයක් හැටියට ද හැඳින්විය හැකි ය. ඉන්පසු 1977 සිට 94 දක්වා 17 වසරක දීර්ඝ කාලය රට ආපස්සට ගිය යුගය යි. එම යුගය නිමාකොට දුව කිරීමේ, සමාදානයේ හා ප්‍රතිනිර්මාණයේ නව යුගය උදාවූයේ 1994 න් පසුව ය. ප්‍රජාතන්ත්‍රය යළි ස්ථාපනය කිරීමේ ගැටළුව නිරාකරණය කිරීමට අප පියවර ගත්තේ මෙම කාලවකවානුවේදී ය.

ප්‍රජාතන්ත්‍රවාදය යනු මැතිවරණ පවත්වා ආණ්ඩු බලයට පත් කිරීම පමණක් නො වේ. එය දේශපාලනයට පමණක් අදාළ කරුණක් ද නො වේ. පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් යනු එම සමාජයේ සෑම පුරවැසියෙකුගේ ම මුවින් ගලා එන වචන මෙන් ම, ජීවන භාවිතාව ද ප්‍රජාතන්ත්‍රවාදී වීම ය. ඒ අතින් ගත් කල සමාජයක් හැටියට අප බොහෝ පසුබෑම්වලට ලක් වී ඇති බව කිව යුතු ය. පවුල, ආගමික සංස්ථාව, දේශපාලන පක්ෂ, මාධ්‍ය, රාජ්‍යය යන සෑම ක්ෂේත්‍රයක ම ජීවන භාවිතාවන් ප්‍රජාතන්ත්‍රීකරණයට ලක් කිරීමේදී, අපට යොමුවීමට සිදුවන්නේ එදා මෙදාතුර ලෝකයේ විශිෂ්ට චින්තකයින් හා දාර්ශනිකයින් සහ නායකයින් අපට ඉගැන් වූ හර පද්ධතිය දෙසට ය. එම වටිනා හර පද්ධතීන් "නීතියේ පාලනය" යන තේමාව යටතේ අද අපට ගොනු කළ හැකි ය. මිනිස් අයිතිවාසිකම් ව්‍යවස්ථානුකූල ව තහවුරු කිරීම මගින් එය කළ හැකි ය. මිනිස් අයිතිවාසිකම් ගරු කිරීම දෛනික ජීවන භාවිතාවක් බවට පත් කිරීම සඳහා චර්යා ධර්ම

පද්ධතියක් අද අපේ සමාජයට අවශ්‍ය ය. ප්‍රචණ්ඩත්වය පිටුදැකීම, යුද්ධය අවසන් කිරීම, පළි නො ගැනීම, "එකා සැමටත් සැම එකාටත්" යන ප්‍රතිපත්තිය තුළ සහෝදරත්වයෙන් බැඳීම සඳහා දේශපාලන නායකයන් හැටියට අප ජන සමාජයට පූර්වාදර්ශයක් දිය යුතු ය.

ගරු කථානායකතුමනි,

අප පක්ෂයේ අසහාය නායකයා වූ ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක දිවංගත අගමැතිතුමා 1951 ජූලි 12 වෙනිදා එක්සත් ජාතික පක්ෂය අත්හැර විරුද්ධ පක්ෂයේ අසුන් ගනිමින් කළ ඓතිහාසික කතාව මෙහිදී මගේ මතකයට නැගේ.

ඒබ්‍රහම් ලින්කන්ගේ ප්‍රකාශයක් උපුටා ගනිමින් ඔහු ප්‍රකාශ කළේ තමා එම දේශපාලන ගමන යන්නේ කිසිවෙකු කෙරෙහි වෛරයකින් නො ව සැමදෙනාගේ සුභසිද්ධිය උදෙසා බව ය.

ගරු කථානායකතුමනි,

"මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීම" යයි එතුමා එදා ඔබේ සමරු පොතේ ඒ උදාර පාඨය සටහන් කළේ මේ අදහස මත යයි මම විශ්වාස කරමි.

එහෙයින් ගරු කථානායකතුමනි,

සමාජයක් හැටියට අප යා යුතු දිශාව හා අප සමාජය මෙහෙයවිය යුතු දිශාව පිළිබඳ වැදගත් ගුරු උපදේශ සතුරාටත් මෙත් වැඩූ බණ්ඩාරනායක ශ්‍රීමතානෝ තම ජීවන භාවිතාව තුළ ඔප්පු කළහ. ඒ මාර්ගයෙන් ඉවත් ව යෑමට ගරු කථානායකතුමනි අපට කිසිදු හේතුවක් නැත. ජීවත්වීමේ නිදහස, භාෂණයේ නිදහස, සිතීමේ නිදහස, වධ හිංසාවලට ලක්වීමෙන් තොර ව ජීවත්වීමේ නිදහස, ආර්ථික හා සමාජීය සමානාත්මතාවට ඇති අයිතිය ඇතුළු ලෝකයේ ශිෂ්ට සම්පන්න සමාජයන් පිළිගන්නා මූලික අයිතිවාසිකම් සමාජයේ ඉහළ සිට පහළ දක්වා සෑම ස්ථරයක ම තහවුරු කිරීම තුළින් අපට මේ ගමන යා හැකිය.

ගරු කථානායකතුමනි,

අද අප විසින් යළි ලබාදුන් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ස්ථාපිත කිරීම ගැනත්, නව දේශපාලන සංස්කෘතියක අවශ්‍යතාව ගැනත් අලුත් සංවාදයක් ඇතිවී තිබේ. ප්‍රජාතන්ත්‍රය තහවුරු කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ගැන නොයෙක් යෝජනා ඉදිරිපත් කොට ඇත.

ප්‍රජාතන්ත්‍රවාදයේ ගැටළු තුන්වන ලෝකයේ අප වැනි රටවලට පමණක් බලපා ඇති කාරණයක් නොවේ. ප්‍රජාතන්ත්‍රයේ හිණිපෙත්තට නැග ඇතැයි අප විශ්වාස කරන බටහිර යුරෝපා රටවල පවා ප්‍රජාතන්ත්‍රය පිළිබඳ ගැටළු මතුවී ඇත. බ්‍රිතාන්‍ය ඇතුළු බටහිර යුරෝපයේ නව වාමාංශයත්, නව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගත් තම රටවල සමාජය තවදුරටත් ප්‍රජාතන්ත්‍රීය කළහැකි මං සොයා බලමින් සිටී. දේශපාලන විද්‍යාව හා ආර්ථික විද්‍යාව පිළිබඳ ලන්ඩන් විද්‍යාලයේ London School of Economics and Political Science අධ්‍යක්ෂ, ඇන්තනි ගිඩින්ස් The Third Way (තෙවෙනි මග) නැමැති සිය පොතේ සඳහන් කර ඇති අන්දමට අද බටහිර යුරෝපා රටවල් මුහුණදී ඇත්තේ ප්‍රජාතන්ත්‍රය ප්‍රජාතන්ත්‍රීකරණයට ලක් කිරීමේ (The Democratising of Democracy) අභියෝගයකට ය. මෙහි තේරුම මේ රටවල පවා ප්‍රජාතන්ත්‍රය කිසියම් අර්බුදයකට මුහුණ දී ඇති බව යි. තමන්ගේ රටවල පවත්නා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ගැන ඇමරිකා එක්සත් ජනපදයේ හා යුරෝපා රටවල් එකොළහක පැවැත්වූ සමීක්ෂණයකදී 90% ක් දෙනා ප්‍රකාශ කර ඇත්තේ ප්‍රජාතන්ත්‍රය කෙරෙහි තමන් පැහැදී සිටින නමුදු තමන්ගේ රටවල ප්‍රජාතන්ත්‍රය තවදුරටත් ශක්තිමත් කිරීමේ මං සොයා බැලිය යුතු බව යි.

ගරු කථානායකතුමනි,

ඒ අනුව වර්තමානයේ අපේ රටේත්, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැටළු මතුවී තිබීම පුදුමයට කරුණක් නො වේ. 1994 අපේ ආණ්ඩුව යටතේ ප්‍රජාතන්ත්‍රය ශක්තිමත්කොට ස්ථාවර තත්ත්වයකට පත්කොට ඇතත් සමස්ත සමාජයේ ම ප්‍රජාතන්ත්‍රය තවදුරටත් පුළුල් කිරීම පිළිබඳ සංවාදයක් දකින්නට ලැබේ. එය සියලු ම සමාජ සංස්ථා තුළ ද,

දේශපාලන පක්ෂ තුළ ද දකින්නට ඇති කාරණයකි. සමස්ත සමාජය පුළුල් ප්‍රජාතන්ත්‍රීකරණයකට ලක් කිරීමේ අත්‍යාවශ්‍ය කාරණයට අපගේ ඉදිරි වැඩපිළිවෙළේ ප්‍රධාන තැනක් හිමිවන්නේ ඒ නිසා ය.

මේ පිළිබඳ ව සළකා බැලීමේදී අපේ වර්තමාන මැතිවරණ ක්‍රමය අපට කොතෙක් දුරට ගැළපේ ද යන්න කෙරෙහි අවධානය යොමු කරන ලෙස මම මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් විශේෂ ඉල්ලීමක් කරමි. අද බොහෝවිට කතා කෙරෙන මැතිවරණ ප්‍රචණ්ඩත්වයට එක් හේතුවක් වී ඇත්තේ මෙම මැතිවරණ ක්‍රමය බවට චෝදනා එල්ල වී තිබේ. එපමණක් නො ව මෙම මැතිවරණ ක්‍රමය තුළින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී කැමැත්ත විකෘතිවී ප්‍රදර්ශනය වන බව මගේ හැඟීම යි. 1994 මැතිවරණ ප්‍රතිඵලය මෙන් ම ඉකුත් ඔක්තෝබර් 10 වෙනිදා මැතිවරණ ප්‍රතිඵලය ද ඊට කදිම නිදසුනකි. එබැවින් ජනතාවගේ කැමැත්ත නියි පරිදි ප්‍රදර්ශනය කෙරෙන්නාවූත්, සුළු පක්ෂවල හා සුළු ජන කොටස්වල නියෝජනය සහතික කෙරෙන්නාවූත් මැතිවරණ ක්‍රමයක් අපි සකස් කරගත යුතු වෙමු. එය අප කලින් හුරුපුරුදු ව සිටි කේවල මැතිවරණ ක්‍රමයේ මෙන් ම සමානුපාතික නියෝජනයේ යහපත් අංග ලක්ෂණ සම්මිශ්‍රනය වූ මැතිවරණ ක්‍රමයක් විය යුතුයයි මම කල්පනා කරමි. ඉදිරියේදී මේ කාරණය කෙරෙහි ඔබේ විශේෂ අවධානය යොමු කරන ලෙස මම කාරුණික ව ඉල්ලා සිටිමි.

සමාජයේ ප්‍රජාතන්ත්‍රීකරණය සඳහා ස්වාධීන මැතිවරණ, පොලිස්, රාජ්‍ය සේවා සහ අධිකරණ සේවා කොමිෂන් සභා පිහිටුවීමේ අවශ්‍යතාව ගැන අද සංවාදයක් ඇතිවී තිබේ.

ගරු කථානායකතුමනි,

ඕනෑම ශිෂ්ඨසම්පන්න රටක පැවැත්ම සඳහා මෙවැනි ස්වාධීන කොමිෂන් සභාවල අවශ්‍යතාව මම පිළිගනිමි. ඒවා පිහිටුවා ක්‍රියාත්මක කිරීමට මම සූදානමින් සිටිමි. අප පසුගිය පාර්ලිමේන්තු වාරයේදී ඉදිරිපත් කළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට මේ සියල්ල ඇතුළත් කළේ ඒ නිසාය. ඒ අනුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හැකිතාක් ඉක්මණින් සම්මත කර ගැනීමෙන් මේ කොමිෂන් සභාද පිහිටුවා ගැනීමට හැකිවන බව පෙන්වාදීමට කැමැත්තෙමි.

ගරු කථානායකතුමනි,

ගෝලීයකරණ සමාජය තුළ ප්‍රජාතන්ත්‍රයේ ගැටළුව නිරාකරණය කරගනු සඳහා අද නව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී විද්වතුන් ඉදිරිපත් කර ඇති යෝජනා අප මුහුණපා ඇති ගැටළුවලට ද හොඳින් ගැළපෙන්නේ යයි මම කල්පනා කරමි. මේ සඳහා ඔවුන් ඉදිරිපත් කර ඇති ප්‍රධාන විසඳුම් දෙකක් නම්, බලය විමධ්‍යගත කිරීම සහ බලය බෙදා හැරීම යි. මෙවැනි බලය බෙදා හැරීමේ වැඩපිළිවෙළකින් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ලැබෙන්නේ සුළුජන කොටස්වලට පමණක් නොවේ. එමගින් විසඳෙන්නේ සුළුජන ප්‍රශ්න පමණක් නොවේ. බහුතර ජන කොටසේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පුළුල් කර ගැනීමේ ගැටළුවට ප්‍රහල විසඳුම් ලබා ගතහැකි ක්‍රමයක් ලෙස මේ විද්වතුන් පෙන්වා දෙන්නේ ද බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීමේ වැඩපිළිවෙළ යි. අපේ රටේ සිංහල ජනතාව ඇතුළු පොදු මහ ජනතාවගේ දේශපාලන, සමාජ හා ආර්ථික අයිතීන් වඩාත් දියුණු කොට ස්ථාපිත කිරීම සඳහා ද යුද්ධයට හා ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් ද බලය බෙදා හැරීමේ වැඩපිළිවෙළ අපට උපයෝගී කරගත හැකි ය. අපේ රටේ යුද්ධයට හා ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම් සෙවීමේදී මෙම ක්‍රියාමාර්ග දෙක ම බෙහෙවින් වැදගත් වන බව අපි නිරන්තරයෙන් පෙන්වාදී ඇත්තෙමු.

## යුද්ධය නිමා කිරීම හා ජාතික ගැටළුවට දේශපාලන විසඳුමක් නිර්මාණය කිරීම

ගරු කථානායකතුමනි,

යුද්ධය නිමා කිරීම හා ජාතික ගැටළුවට දේශපාලන විසඳුමක් සෙවීම අපගේ අනෙක් අභියෝගය යි. එය මුල් අභියෝග දෙක සමග ම බද්ධ වී ඇති අභියෝගයකි. සමාජයේ පූර්ණ ප්‍රජාතන්ත්‍රීකරණය, ආර්ථික සංවර්ධනය මගින් සමාජයේ අසමානතා තුරන් කිරීම සහ ජාතික ගැටළුවට විසඳුමක් සෙවීම යන කාරණා තුන වෙන් කළ නො හැකි අන්දමින් එකිනෙකට බැඳී පවතින අභියෝග යි. ජාතික ගැටළුව මේ රටේ ප්‍රජාතන්ත්‍රය පිළිබඳ ප්‍රශ්නයකි.

අද පවත්නා ජාතික ගැටළුවට පැහැදිලි ප්‍රබල දේශපාලන හේතුවක් බලපා ඇති බව අපගේ පිළිගැනීම ය. එම දේශපාලන හේතුව අන් කිසිවක් නොව ගැටළුවට යෙදිය යුතු පිළියම සම්බන්ධයෙන් දේශපාලනමය එකඟතාවක් නොමැති කම යි. යුද්ධය ජාතික ගැටළුවේ අතුරු ඵලයක් වන්නේ ය. විසඳීමට ඇති ප්‍රශ්නය කුමක්දැයි කෙස් පැළෙන වාද, විවාද ඇති තරම් බිහිවී ඇත. තුනෙන් දෙකේ ඡන්දය නැතිව පවත්නා ව්‍යවස්ථා රාමුව තුළ අලුත් ව්‍යවස්ථාවක් සම්මත කර ගන්නේ කෙසේදැයි තවත් කණ්ඩායම් ප්‍රශ්න කරති. එහෙත් අවුරුදු 50 ක් තිස්සේ ගෙනගියාවූ එකී තර්ක වාද හා න්‍යාය මගින් ප්‍රශ්නයට විසඳුමක් නො ලැබුණේ ය යන්න මගේ අවංක විශ්වාසය යි.

ගරු කථානායකතුමනි,

න්‍යාය කප්පරකට වඩා මංචාඩියක් තරම් වූ ප්‍රයෝගිකත්වයෙහි වටිනාකමක් ඇතැයි කියමනක් තිබේ. අද පවතින ගැටළුව කෙරෙහි ප්‍රයෝගික විසඳුම් සෙවීමට කැපවී සිටින අපගේ විසඳුම් මාර්ගයට මග පෙන්වන්නා වූ ප්‍රතිපත්තිය පැහැදිලි කිරීමට මට අවසර දෙන්න. සුළු ජන කොටස්වලට සාධාරණව දේශපාලන, සමාජ, ආර්ථික බලයට හවුල්වීමට ඉඩ නො ලැබීම රටේ ජාතික ගැටළුවේ මූලික හේතුව යි. එය ඔබේ හෝ මගේ හෝ මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ජනතාවගේ ගැටළුවක් නො වේ. අප රටේ ක්‍රියාත්මක වන්නා වූ ආණ්ඩු ක්‍රමයේ ගැටළුවකි. අප පශ්චාත් යටත් විජිත රාජ්‍ය ගොඩනැඟීමේදී බහුවිධ සමාජයකට ගැළපෙන පරිදි ප්‍රජාතන්ත්‍රවාදී විකල්ප නිර්මාණය කරගත්තේ නැත. අඩ සිය වසක් තිස්සේ ඉතිහාසය විසින් අපට භාර කරන ලද නවත ම වගකීම වන නව ශක්තිමත් හා එක්සත් ශ්‍රී ලාංකීය ජාතියක් ගොඩනැගීමේ කාර්යය සාර්ථක ව ඉටු කර ගැනීමට අපට නො හැකි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කාලාන්තරයක් තිස්සේ සහෝදරත්වයෙන් විසූ ජන කොටස් අතර යුද ගිණි ඇවිලී ගිය අභාග්‍යසම්පන්න ඉරණමකට මුහුණදීමට සිදුවිය. පවත්නා රාජ්‍ය තුළින් තමන්ට අසාධාරණයක් සිදුවෙතැයි යන හැඟීම සුළු ජන කොටස් අතර පැතිර ගියේත්, ඇත්ත වශයෙන් ම එවැනි අසාධාරණකම් සිදුවූයේත්, රටට නො ගැළපෙන බල සම්මුතියක් නිර්මාණය කළ යටත් විජිතවාදී ආණ්ඩුක්‍රම රාමුවෙන් මිදීමට අපට නො හැකි වූ නිසාය.

1983 න් පසු සෘජු යුද්ධයක් බවට පත් වූ මෙම ගැටුම, යුද්ධය නිසා ම නිර්මාණය වූ සාධක ද පෙරටුකොට ගෙන ඉදිරියට ඇදී යයි. ඒ නිසා අපට ප්‍රශ්නය දෙස බැලීමට සිදුවී ඇත්තේ එය අතීතයේ පැවැති ආකාරයට නො ව අද දවසේ පවත්නා ආකාරයට ය. ඒ අනුව ප්‍රායෝගික විසඳුම් සෙවීමේදී විකල්ප ක්ෂේත්‍ර තුනක ක්‍රියාකාරීවීමට අපට සිදුවී ඇත. ඒවා නම් :

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය
(2) ජාතික ඒකාබද්ධතාව පදනම් කර ගනිමින් දේශය යළි ගොඩ නැගීම.
(3) ත්‍රස්තවාදයට එරෙහි හමුදා ක්‍රියාමාර්ග

යන අංශ තුනයි.

ගරු කථානායකතුමනි,

මා ඉහත විකල්ප අනුපිළිවෙළට ඉදිරිපත් කළත් ඒවා ක්‍රියාත්මක කළයුත්තේ එකක් පසුපස එකක් වශයෙන් නො ව එකිනෙකට සමාන්තරව ය. එකවිට ම ය. එකිනෙකට අනුබද්ධ ව ය.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය

දැනට ක්‍රියාත්මක වන 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම රාමුව ජාතික ගැටළුව විසඳාලීමෙහි අපොහොසත්වන බව අපි දුටුවෙමු. එම කාරණය පිළිබඳ ව මේ ගරු සභාවේ විවිධ පක්ෂවලට අයත් මන්ත්‍රීවරුන් විවිධ මත දැරුව ද මේ කාරණය පිළිබඳ ව ඔවුන් පොදුවේ එකඟවන බව මම දනිමි. අප අතර මතබේද ඇත්නම් ඒවා ඇතිවී තිබෙන්නේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයේදී අප යොදාගන්නා ඇතැම් පියවර කිහිපයක් සම්බන්ධයෙන් පමණි. එහෙත් ජාතික ගැටළුව විසඳීම ඉලක්ක කරගත් ආණ්ඩුක්‍රමයක් නිර්මාණය කර ගැනීමේදී ඔබ, අප අන් කාටවත් බැහැර කළ නො හැකි එක් මූලධර්මයක් තිබේ. එනම් අප සමාජයේ බහුවිධ පදනම පිළිගනිමින් "පුරවැසියා බහුවිධ ප්‍රජාතන්ත්‍රවාදයේ සාධනීය හවුල්කරු ලෙස දිරිමත් කිරීමේ" ආණ්ඩුක්‍රම රාමුවක් නිර්මාණය කළ යුතු ය යන පදනම යි.

බලය බෙදා හැරීම එවැනි ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණය යි. කේන්ද්‍රයේ බලය බෙදා හැරීම, ස්වාධීන කොමිෂන් සභා ගණනාවකට ආණ්ඩු මට්ටමේ හා පරිපාලනයේ වැදගත් අංශ පැවරීම, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, ආර්ථික හා සාමාජික අයිතිවාසිකම් ද ඇතුළත් දියුණු මූලික අයිතිවාසිකම් සමුදායක් හඳුන්වාදීම යනාදී වැදගත් අංග ලක්ෂණ රැසකින් යුත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් අපි සකස් කළෙමු. එය පසුගිය පාර්ලිමේන්තුව නියෝජනය කළ සියලුම දේශපාලන පක්ෂවල නියෝජිතයින්ගෙන් සමන්විත කාරක සභාවක් තුළ සංවාදයකට ලක්කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අපට හැකි විය. එම ව්‍යවස්ථාවේ ඉහත කී අංග ලක්ෂණ අඩංගු වූයේ අපගේ හිතු මනාපය අනුව නො ව 1959 බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුමේ සිට 1992 මංගල මුණසිංහ තේරීම් කමිටු වාර්තාව දක්වා වූ දේශපාලන විසඳුම් යෝජනා සකස් කිරීමේ ක්‍රියාදාමය තුළ මතු වූ සාධනීය යෝජනා ද ජාත්‍යන්තර අත්දැකීම් ද සැළකිල්ලට ගනිමින් ය. 1999 දෙසැම්බර් ජනාධිපතිවරණයෙන් ජය ගැනීමෙන් පසු සියලු දේශපාලන පක්ෂ සමගත්, විශේෂයෙන් ම එක්සත් ජාතික පක්ෂය සමගත් අප රජය දීර්ඝ වශයෙන් සාකච්ඡා කළේ ය. කෙටුම්පතේ ඇතුලත් කරුණු වලින් අතිබහුතරයක් පිළිබඳ ව එකඟත්වයක් ඇති කර ගැනීමට අපට හැකි විය. ඉන්පසු පසුගිය අගෝස්තු 3 වෙනිදා මම එය මෙම ගරු සභාවට ඉදිරිපත් කළෙමි. එහෙත් ඉතිහාසය පුරා ක්‍රියාත්මක වූ විරෝධාකල්ප දේශපාලනය එයට හරස්විය.

එහෙත් ගරු කථානායකතුමනි,

එම මාර්ගය හැර ජනසමාජයක් ලෙස අපට වෙනත් ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයන් තිබේ ද? එහෙයින් හුදු විරෝධාකල්ප වෙනුවෙන් නො ව, රටේ ගැටළු පිළිබඳ බැරෑරුම් සහගත වන දේශපාලනයක් වෙනුවෙන් නැවුම් හැඟීම් පෙරදැරි කරගෙන මේ ප්‍රශ්නය පිළිබඳ ව යළිත් කල්පනා කරන මෙන් මේ ගරු ජනතා නියෝජිතයින්ගෙන් මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිමි. අප නැවතත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ විකල්පයට යා යුතු ව තිබේ.

මහා සංඝරත්නය ඇතුළු පිරිසකට මේ පිළිබඳව අදහස් දැක්වීමට ඉඩකඩක් අවශ්‍යය යන ඉල්ලීමක් පසුගිය කාලයේදී ඉදිරිපත් කෙරුණි. ඇත්ත වශයෙන්ම 1995 සිට මේ දක්වාම අප එවැනි සාකච්ඡා හැකිතරම් ඇති කළෙමු. එහෙත් එහි ප්‍රමාණවත්භාවය පිළිබඳව තවදුරටත් ගැටළුවක්වේ නම් ඒ සඳහා ඉඩකඩක් විවෘත කිරීමට සූදානම් බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරමි.

## ජාතික ඒකාබද්ධතාව පදනම් කර ගනිමින් දේශය යළි ගොඩ නැගීම

ගරු කථානායකතුමනි,

ජාති භේදයෙන් තොර එක්සත් ශ්‍රී ලංකාවක් පිළිබඳ ව අපේ රටේ නිදහසේ නිර්මාතෘවරුන් සිහින දුටුවේ ශ්‍රී ලංකාවට නිදහසේ හිරු උදා වූ මුල් යුගයේදී ම ය. ජාතික ඒකාබද්ධතාව පිළිබඳ ව ඔවුන් තුළ වූයේ නො සැලෙන අධිෂ්ඨානයකි. 1998 පෙබරවාරි 4 වෙනිදාට යෙදුනු නිදහසේ ස්වර්ණ ජයන්ති උළෙලේදී ජාතිය අමතා මා කළ කතාවේදී කළ සඳහනක් මේ අවස්ථාවේදී මගේ සිහියට නැගේ. එම කතාවේදී මම මෙසේ සඳහන් කළෙමි.

> එදා 1948 දී අපේ මුතුන් මිත්තන් නිදහසේ මාවතේ මුල් පියවර ඉදිරියට තබනවිට ඔවුන් දුටුවේ නියම ලෙස නිදහස් වූ එක්සත් ශ්‍රී ලංකාවකි. ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය, ඩී.එස්. සේනානායක මහතා 1948 පෙබරවාරි 4 වෙනිදා ජාතික කොඩිය එසවීමෙන් පසු මෙසේ ප්‍රකාශ කළේය.
>
> 'අපේ රට බොහෝ ජාතීන්ගෙන් හා වාර්ගිකයින්ගෙන් සමන්විත ය. ඒ සියලු දෙනාට ම තමන්ගේ ම සංස්කෘතියක් හා ඉතිහාසයක් ඇත. සාමය, සුරක්ෂිතභාවය, සියලු ජනතාවට සාධාරණත්වය සලසාදීමේදී අප අතර ඇති සියලු හොඳ දේ එකතු කර ගැනීම අපේ වගකීම යි.'

1945 නොවැම්බර් 8 වෙනිදා රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී එතුමා මෙසේ ද ප්‍රකාශ කළේ ය.

සියවස් ගණනාවක් මුළුල්ලේ සිංහල හා ද්‍රවිඩ ජනතාව සාමයෙන් හා සමගියෙන් යුතු ව ජීවත් වූහ. දෙමළ රජවරුන් විසින් අප ද, අපගේ රජවරුන් විසින් ඔවුන් ද පාලනය කර තිබේ. මේ සියලු ජාතීන් එකමුතු කිරීම තරම් වූ වෙනත් අභිමතාර්ථයක් මට මගේ ජීවිතයේ තවත් නැත. (රාජ්‍ය මන්ත්‍රණ සභාව 1945.11.09 වෙනිදා)

ශ්‍රී ලංකාවේ උදාර පුත්‍රයෙකුවූ ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම් මැතිතුමා ද 1917 දෙසැම්බර් 15 වෙනිදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ ප්‍රථම සමුළුවේදී මේ ආකාරයෙන් ම කතා කළේය.

'කිසිම වැඩපිළිවෙලක් සර්ව සම්පූර්ණ ව හා සැම කෙනෙකුට ම සතුටු කළ හැකි වැඩපිළිවෙලක් විය නො හැක. අප සියලුදෙනා ම වාසි ලබා ගන්නවා මෙන් ම අන් අයට එම වාසි ලබා දෙන්නටත් සූදානම් විය යුතු ය. අපේ අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා සියලු මතබේද හා වෙනස්කම් අමතක කොට එක්සත් පෙරමුණක් ගොඩ නගා ගතයුතු ය. වාර්ගික පදනමකින් කෙරෙන නියෝජනය, අනර්ථකාරී බව අප සියලුදෙනාගේ හැඟීම යි. එය වඩාත් පුළුල්වූ බේදකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතු වී ඇත. එසේ ම එය අපේ සාමයට හා සමගියට බාධා පමුණුවා තිබේ.'

1958 ජුලි 17 වෙනිදා දෙමළ භාෂා පණත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා කළ ප්‍රකාශය මම ගෙන හැර දක්වමි. එතුමා මෙසේ පැවසී ය.

'අප ලබාගෙන ඇති මෙම නිදහස යටතේ අනාගතයට ගමන් කොට ප්‍රගතියක් අත්පත් කර ගැනීමට අපට හැකිවේ. .............. මෙය සිංහල ජනතාවගේ නිදහස පමණක් නො වේ. දෙමළ

ජනතාවගේ, මුස්ලිම්වරුන්ගේ, මැලේ හා බර්ගර් වරුන්ගේ නිදහස බව ද මතක තබා ගන්න.' නිදහස ඒ ආකාරයෙන් අප සියලු දෙනා සඳහා නොවේනම් නිදහස වෙනුවෙන් සිරබත් කෑ සහ ඒ වෙනුවෙන් වසර ගණනාවක් දුක් විඳි ශ්‍රී ජවහර්ලාල් නේරු තුමා කිව් වචන මට මෙහිදී නැවතත් ප්‍රකාශ කිරීමට සිදුවෙයි.

'නිදහස යනු අභ්‍යන්තර ජාතිවාදී කලකෝලාහල හෝ සුලු ජාතීන්ට සිදුවන අසාධාරණයක් හෝ ඔවුන් මර්දනය කිරීම නාම් ස්වරාජ්‍ය යකාට ගියදෙන්' යයි එදා නේරු තුමා ප්‍රකාශ කළේ ය.

එක්සත් වූ ප්‍රබල ජාතියක් ගොඩ නැගීම සඳහා අපගේ නිදහස් සටන්කාමීන් තුළ වූ සිහිනය සැබෑ කර දීමට අපි අපොහොසත් වී සිටිමු. ඉපැරැණි ශිෂ්ඨාචාරයකට උරුමකම් කියන ලෝකයේ ශ්‍රේෂ්ඨත ම සංස්කෘතික හා කලා ශිල්පයන්ගෙන් සුසැදුණු උරුමයක් හිමි එසේ ම සාමය, ඉවසීම හා මෛත්‍රිය පදනම් කර ගත් උදාර බෞද්ධ දර්ශනයේ සම්ප්‍රදායන් පෝෂණය කරන ශ්‍රේෂ්ඨ ජාතියක් වාර්ගික දේශපාලන හා සමාජ ප්‍රචණ්ඩත්වයේ බිහිසුණු යුගයකට ඇද වැටෙද්දී, අපේ රටේ නිශ්ශබ්ද බහුතර ජනතාව භීතියෙන් යුතු ව ඒ දෙස බලා සිටිති. සාමය හා සමගිය සඳහා කෙරෙන ආයාචනයෙන් අපේ ජනතාව අවදිව සිටිති. පිබිදිව සිටිති.

> සමගිය, සමාදානය, සහෝදරත්වය වෙනුවෙන් දෙගුණ, තෙගුණ වෙමින් නැගෙන මිහිරි නාදයෙන් වෛරය හා ප්‍රචණ්ඩත්වය සඳහා අන්තවාදී අතළොස්සක් නගන කර්කශ ඝෝෂාව යටපත්වී ඇත. අප රටේ ජනතාවට තවදුරටත් ඊර්ෂ්‍යාවේ, බල ලෝභයේ සහ ක්‍රෝධයේ මඩ ගොහොරුවේ ගිලෙන්නට අප කිසිසේත් ඉඩ නො තබමු.

ගරු කථානායකතුමනි,

බලය බෙදා හැරීමේ ආණ්ඩු ක්‍රමයකින් බලය බෙදා දෙන්නේ කාටදැයි ඇතැම් අය අසති. මේ අසන්නේ අනෙකක් ගැන නොව එල්.ටී.ටී.ඊ.

සංවිධානය ගැන ය. රටේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට එක්වීමට එල්.ටී.ටී.ඊ. සංවිධානයට ඇති ඉඩකඩ අප කිසිසේත් වසා නැත. එම සංවිධානය සමග සාකච්ඡා කිරීමට අප සූදානම් ය. එහෙත් සාකච්ඡා කළයුත්තේ මොනවාද යන්න නිශ්චය කර ගත යුතු ව තිබේ. සාකච්ඡා යනුවෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය අදහස් කරන්නේ භාණ්ඩ තහනම ඉවත් කිරීම, ආහාර යැවීම යනාදී ඔවුන්ට ප්‍රයෝජනවත් වන ඉල්ලීම් පමණක් නම් එයින් සෙතක් අත්වන්නේ නැත. මන්ද, එවැනි පියවර අප දැනටමත් පටන්ගෙන ඇති බැවිනි. යුද්ධයෙන් වැනසුනු උතුරු නැගෙනහිර පළාත් ගොඩ නැගීම අප රජයේ ප්‍රධාන කාර්යයකි. ඒ සඳහා නව අමාත්‍යාංශයක් අප පිහිටුවා ඇති අතර සන්නද්ධ දේශපාලනය අතහැර, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට පිවිසි දමිළ දේශපාලන පක්ෂයක නායකයෙකුට අපි එම අමාත්‍යධූරය ලබාදී ඇත්තෙමු. එහෙයින් එල්.ටී.ටී.ඊ.ය අප සමග සාකච්ඡා කළයුත්තේ නිශ්චිත දේශපාලන කරුණුය. ප්‍රධාන සුළු ජන වර්ගය වන දෙමළ ජනතාව උතුරු නැගෙනහිර මෙන් ම මේ රටේ සෑම තැනක ම වාසය කරති. දෙමළ ජනතාවගේ පැත්තෙන් බැලුව ද උතුරු නැගෙනහිර පමණක් වෙන ම රාජ්‍යයක් බිහි කිරීමෙන් දෙමළ ජනතාවට විමුක්තිය උදා වන්නේ නැත. සියලු ම ජන කොටස් වලට විමුක්තිය උදා වන්නේ එක්සත් රටක් තුළ ජීවත්වීමෙන් පමණි. එහෙයින් එක්සත් රටක් තුළ බලය බෙදා ගැනීම යනුවෙන් අද ඉදිරිපත් වී ඇති හොඳ ම ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයට එල්.ටී.ටී.ඊ. සංවිධානය යහපත් ප්‍රතිචාර දැක්විය යුතු ව තිබේ. ඒ සඳහා ඇති කිසිදු දොරටුවක් අවහිර නො කිරීමට අපි වග බලා ගනිමු.

ගරු කථානායකතුමනි,

සාමකාමී සාකච්ඡා මාර්ගයෙන් ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සෙවීම සඳහා නෝර්වේ රාජ්‍යයේ මැදිහත්වීම පිළිබඳව මේ අවස්ථාවේ යමක් සඳහන් කිරීමට මම කැමැත්තෙමි. යුද්ධයෙන් සිදුවන විනාශය වළක්වා සාමකාමී මාර්ගයෙන් ප්‍රශ්නය විසඳා ගැනීමට අපි මුල සිට ම උත්සාහ දැරුවෙමු. 1994 දී අප බලයට පත්වී නොබෝ දිනකින් ම ආරම්භ කලේ සාම ක්‍රියාදාමය යි. එහෙත් එල්.ටී.ටී.ඊ.යෙන් අපට තියි ප්‍රතිචාරයක් ලැබුනේ නැත. යලිත් යුද්ධ කරන්නට සිදුවූයේ සාමයට

දිගු කළ අත එල්.ටී.ටී.ඊ.ය ප්‍රතික්ෂේප කළ නිසා ය. යුද්ධය සිදුවන අතරතුරේ පවා සාමකාමී සාකච්ඡා සඳහා වරින් වර දැරූ උත්සාහයන් අප ප්‍රතික්ෂේප කළේ නැත. දැන් නෝර්වේ රාජ්‍යය මේ සම්බන්ධයෙන් මැදිහත් වී සිටී. ඔවුන් අපට දන්වා ඇත්තේ සාකච්ඡා ආරම්භ කිරීමට යම් යම් කොන්දේසි කිහිපයක් බලපාන බව යි. එහෙත් මේ කොන්දේසි මොනවාදැයි තවමත් තීරණය කොට නැත. සාම සාකච්ඡා පිළිබඳ ව තීරණයක් ගැනීමේදී එල්.ටී.ටී.ඊ.යේ අතීත ක්‍රියා කලාපය සැලකිල්ලට ගත යුතු ය යන මතයට මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් එකඟ වෙනවා ඇතැයි මම බලාපොරොත්තු වෙමි. වසර 15 ක කාලයක් මුළුල්ලේ විවිධ ආණ්ඩු මුළා කල ආකාරයෙන් ඔවුන් නැවතත් අප මුළා කරන්නට සූදානම් වන්නේ ද යන කාරණය දැඩි විමසිල්ලට ලක් කළ යුතු ව තිබේ. කෙසේවෙතත්, නෝර්වේ රාජ්‍යය මැදිහත් වී අදාළ කොන්දේසි මොනවාදැයි ඉදිරිපත් කිරීමෙන් පසු අදාල සියලු පාර්ශ්ව සමග ඒ පිළිබඳව සාකච්ඡා කොට තීරණයක් ගැනීම අපගේ බලාපොරොත්තුව යි. එතෙක් ත්‍රස්තවාදයට යුද්ධයෙන් පිළිතුරු දීමේ අපගේ වැඩපිළිවෙල කිසිසේත් අත් නොහරිමු.

ගරු කථානායකතුමනි,

එල්.ටී.ටී.ඊ. ය සමග සාම සාකච්ඡා පැවැත්වීම පිළිබඳ අපේ ප්‍රතිචාරය එබඳු වන අතර දෙමළ ජනතාවගේ සාධාරණ ප්‍රශ්න වලට විසඳුම් ලබාදීමේ අපේ මූලික ප්‍රතිපත්තිය කිසි ලෙසකින් වෙනස් කර නැති බව මේ අවස්ථාවේ සඳහන් කිරීමට කැමැත්තෙමි. මේ ප්‍රශ්නයට විසඳුම් ලබාදීම සඳහා අප ඉදිරිපත් කළ ප්‍රතිපත්තියට පසුගිය වසර හතක කාලයක් මුලුල්ලේ පැවැති මැතිවරණ වලදී පැහැදිලි ජනවරමක් ලැබී තිබේ.

ගරු කථානායකතුමනි,

ප්‍රජාතන්ත්‍රය යනු සියලුදෙනාගේ එකඟත්වය ලැබීමය යන වැරදි නිගමනයකට අප එළඹිය යුතු නැත. ප්‍රජාතන්ත්‍රය යනු බහුතරයේ එකඟත්වයයි. කිසිම ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කවරදාකවත් සියයට සීයක එකඟත්වයක් බලාපොරොත්තු විය නො හැකි ය. එවැනි ක්‍රමයක් කිසිදු ප්‍රජතන්ත්‍රවාදී රටක ක්‍රියාත්මක වන්නේ නැත. එම නිසා

ප්‍රශ්නයට විසඳුමක් සෙවීමේ දී සියලු දෙනාගේ ම එකඟත්වය ලැබෙනතුරු බලා සිටීම නිවැරැදි ක්‍රියා මාර්ගය නො වන බව මගේ හැඟීම යි.

ගරු කථානායකතුමනි,

ලංකා දේශපාලන ඉතිහාසය තුළ මෙතෙක් බිහි වී ඇති පුළුල් ම ජාතික සන්ධානය අපේ රජය යි. කාලාන්තරයක් තිස්සේ වෙන ම රාජ්‍යයක් වෙනුවෙන් සටන් කළ බලවේග රාශියක් අපේ ප්‍රජාතන්ත්‍රවාදී විකල්ප විසඳුම් කෙරෙහි විශ්වාසය තබමින් අපට එක්වී සිටීම අපගේ ජයග්‍රහණයකි. මේ ජාතික සන්ධානය තවත් පුළුල් කිරීම අපගේ අභිලාෂය යි. ආයුධ ගෙන සටන් වදිනා බලවේගවලට එසේ සටන් වැදීමට බලපාන හේතු අප නැති කළ යුතු ව තිබේ. ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පෙරමුණු ආණ්ඩු මනා ආදර්ශයක් දී ඇත.

ගරු කථානායකතුමනි,

1971 අප්‍රේල් කැරැල්ල දියත් කරමින් ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ කැරැළිකරුවන් පහර දුන්නේ ඒ වනවිටත් ළදරු අවස්ථාවේ පැවැති සමගි පෙරමුණු ආණ්ඩුවට විරුද්ධව ය. ඒ අවස්ථාවේ දී රාජ්‍ය නායිකාව වූ ඒ අසහාය නායිකාව, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය එදා කටයුතු කළේ සමස්ත කැරැලිකාරීත්වය ම සමූලඝාතනය කරමින් නො වේ. ජීවිත හානි අවම කර ගනිමින් කැරැල්ලේ නායකයින් ඇතුළු වැඩි දෙනෙකුගේ ජීවිත ආරක්ෂා කරමින් ඔවුන් ප්‍රජාතාන්ත්‍රවාදී ප්‍රවාහයට ගෙන ඒමට එතුමිය කටයුතු කළා ය. කැරැල්ලට බලපෑ සමාජ, ආර්ථික, දේශපාලන හේතු වලට පිළියම් සෙවීමේ ප්‍රතිසංස්කරණ රැසක් ද එතුමිය දියත් කළා ය. එදා කැරැල්ලට එක් වූ වැඩි දෙනෙකු පසු ව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රියාවලියට එක්කර ගැනීම එතුමිය ගත් තවත් එඩිතර තීරණයකි. ඔවුන්ගෙන් කිහිපදෙනෙක් මාගේ රජයට ද එක්වී එහි විවිධ වගකීම් දරමින් සිටිති. එහෙත් ජනතා විමුක්ති පෙරමුණේ දෙවෙනි කැරැල්ලේ දී එය එසේ සිදු නොවිණි. සිදුවූයේ සමූලඝාතනයකි. ජනතා විමුක්ති පෙරමුණේ තුන්වන පරම්පරාවට

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයට එක්වීමට අවකාශ ලැබුණේ නැවතත් පොදු පෙරමුණු රජයක් යටතේ ය. එනම් 1994 න් පසුව ය. දකුණේ භීෂණය ප්‍රජාතන්ත්‍රවාදී විකල්ප ඔස්සේ තුරන් කළ අප උතුරට නිර්දේශ කරන්නේ ද එවැනි ක්‍රියාමාර්ගයක් බව මේ ගරු සභාවට පෙන්වාදීමට මම කැමැත්තෙමි.

ගරු කථානායකතුමනි,

යුද්ධය අවසන්වී ජනවාර්ගික ප්‍රශ්නයට වැඩිදෙනාගේ එකඟත්වයෙන් සාමකාමී විසඳුමක් ලබාගනු දැකීම සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමියගේ ද එක ම අභිලාෂය විය. පසුගිය වසරේ දෙසැම්බර් 28 වෙනි දා එතුමිය මහා සංඝරත්නයත්, සියලු ම ආගමික පූජ්‍ය ප්‍රසාදීන් වහන්සේත්, සියලු ම දේශපාලන පක්ෂ නායකයින් ඇතුළු සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාව අමතමින් කළ ආයාචනයෙන් බිඳක් මම මේ අවස්ථාවේ සිහිපත් කිරීමට කැමැත්තෙමි. එතුමිය මෙසේ කීවා ය.

> "මෙම තීරණාත්මක අවස්ථාවේ දී යුද්ධය කෙසේ ආරම්භවී ද, එහි වගකීම බාර ගතයුත්තේ කවුරුන් ද යන ප්‍රශ්නය මත පිහිටා තර්ක කිරීමෙන් කිසිදු ප්‍රයෝජනයක් කිසිවෙකුටවත් අත් නොවනු ඇත. අප කළයුත්තේ එවන් දෑ පසෙක තබා මෙම ප්‍රශ්නය විසඳීම සඳහා ජාති, ආගම්, කුළ හා දේශපාලනය මත පිල්බෙදී බලය ලබා ගැනීම සඳහා ක්‍රියාකිරීමේ පටු මතවාද බැහැර කර අධිෂ්ඨානශීලී ව හා බුද්ධිමත් ව කටයුතු කිරීම යි."
>
> "........ විපක්ෂ නායකතුමාටත්, එතුමාගේ පක්ෂයටත්, එම පාක්ෂිකයින්ටත් පොදුවේ මුහුණදීමට ඇති අභියෝගාත්මක ප්‍රශ්නය වන්නේ ද මෙම කරුණම යි. එතුමාණන්ගෙන් මාද ඉල්ලා සිටින්නේ පවතින මතවාද එක් වී සාකච්ඡාකොට සියලු දෙනාට ම පිළිගත හැකි සාධාරණ අදහස් ඉදිරිපත් කිරීමෙන් මෙම ජාතික ප්‍රශ්නය විසඳීමට සහාය වන ලෙසය."

ගරු කථානායකතුමනි,

මෙය හුදෙක් හොඳ හිත මත පමණක් කළහැකි දෙයක් නොවේ. අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ රැසක් ඒ උදෙසා දියත් කළ යුතු ව තිබේ.

එහෙයින් ඒ සඳහා දැරෙන යහපත් ප්‍රයත්නයන්ට විරෝධාකල්ප දේශපාලනයට යට නොවී, සහයෝගය දෙන මෙන් මේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටිමි.

## උතුරු නැගෙනහිර අන්තර්වාර පාලන සභාවක් පිහිටුවීම

දේශපාලන විසඳුමක් සඳහා හදිසි ක්‍රියාමාර්ග කිහිපයක් ගැනීමට මගේ රජය තීරණය කොට ඇත. ඒ අනුව ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය මෙන් ම තවත් එවැනි ම වූ හදිසි අවශ්‍යතාවක් ලෙස සළකා උතුරු නැගෙනහිර ප්‍රදේශවල සිවිල් පරිපාලනය තහවුරු කිරීමේ මූලෝපායක් වශයෙන් උතුරු නැගෙනහිර සියලු ජන කොටස් වල නියෝජිතයින්ගෙන් සමන්විත වූ අන්තර්වාර පාලන සභාවක් පිහිටුවීමට අපි අදහස් කරමු.

## ත්‍රස්තවාදයට එරෙහි හමුදා ක්‍රියාමාර්ග

ජාතික ධනයෙන් යුද්ධය සඳහා විශාල වැය බරක් දැරීමට අපට සිදු වී ඇත. එහෙත් මේ රට බෙදීමට අපි කිසිවෙකුටවත් ඉඩ නො දෙමු. ඒ සඳහා වීරෝධාර ලෙස සටන් කරන ආරක්ෂක හමුදාවක් අපට සිටී. ඔවුන් සටන් කරන්නේ තවත් ජාතියකට එරෙහි ව නො ව පැසිස්ට්වාදී උන්මාදයක ග්‍රහණයකට ලක් වී ඇති ජනතාවක් එයින් මුදවා ගැනීම පිණිස ය. එහෙත් එම යුද්ධය ඉක්මණින් නිමා කිරීම අපගේ අභිලාෂයයි. එම යුද්ධය කෙරෙන්නේ ද ජාත්‍යන්තර නීතිය තුළ අප පිළිගත් ප්‍රතිපත්තීන්ට අනුව ය. අප ළමයින් යුද්ධයට යවා නැත. යුද්ධයෙන් ආබාධිතවූවන් රැක බලා ගැනීමට හා විපතට පත්වූ පවුල් රැක බලා ගැනීමටත් පුළුල් වැඩසටහන් අපි ක්‍රියාත්මක කරමින් සිටින්නෙමු. යුද්ධයෙන් බිඳ වැටුණු ප්‍රදේශ යළි නගා සිටුවීමේ සහ එහි ජන ජීවිත පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන් ද අපි අරඹා ඇත්තෙමු. එහෙයින් කවර තර්ජන පැමිණිය ද සන්නද්ධ ත්‍රස්තවාදයෙන් රට ගළවා ගැනීම සඳහා අභීත ව සටන් කරනා බව මෙහි දී ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

ගරු කථානායකතුමනි,
ගරු මන්ත්‍රීවරුනි,

මා මෙතෙක් විස්තර කළ මේ සියලු අරමුණු සාක්ෂාත් කර ගැනීමට

නම් අප අතර අන්‍යොන්‍ය සහයෝගය සහ එකඟත්වය අවශ්‍ය ය. 1999 දෙසැම්බර් 22 දින දෙවෙනි වරට ජනාධිපතිධුරයේ දිවුරුම්දීමෙන් පසු මා ජාතිය අමතා කළ කතාවේ දී ප්‍රකාශ කළ කරුණු මෙම මැතිවරණ ප්‍රතිඵලයෙන් පසුව ද හොඳාකාරව ම ගැළපෙන්නේ යයි මම කල්පනා කරමි. මම එදා මෙසේ ප්‍රකාශ කළෙමි.

"මේ රටේ ජනතාව තමන්ගේ අභිප්‍රාය කුමක්දැයි පැහැදිළිව ම ප්‍රකාශ කොට ඇත. ඔවුන්ට සාමය අවශ්‍ය යි. ඒ සඳහා ඔවුන් සාමය වෙනුවෙන් පෙනී සිටින නායිකාවක තෝරාගෙන ඇත. ඔවුන්ට ජාතික සමගිය අවශ්‍යයි. ඒ අනුව අපේ බලවේග ශක්තිමත් කිරීමේ හැකියාව ඇතැයි ඔප්පු කොට ඇති නායිකාවක ඔවුන් තෝරාගෙන ඇත. ඔවුන්ට සහෝදරත්වය ද අවශ්‍ය බව සහතිකය. ඒ අනුව ඔවුන් ශක්තිමත් ජනාධිපතිවරයෙකු තෝරා ගත්තා පමණක් නොව ඉතාමත් ශක්තිමත් විපක්ෂයකට ද ස්වකීය සහයෝගය පළ කර තිබේ."

"අප දිනාගෙන ඇති ජයග්‍රහණයේ ප්‍රමාණයේ තේරුම කුමක්දැයි අප හොඳින් අවබෝධ කරගත යුතු යයි මම විශ්වාස කරමි. සාමයේ පහන් සිළුව ජාතියේ එක් කොටසක් රැගෙන යද්දී, අනෙක් කොටස නිකම් බලා සිටීමේ තත්ත්වයක් අපේ ජනතාව බලාපොරොත්තුවන්නේ නැති බව මට ඉතා පැහැදිළිය. ඉරණම විසින් අප මත පටවා ඇති මේ බර පක්ෂ දෙක විසින් ම බෙදා හදාගත යුතු යයි අපේ ජනතාව අදහස් කරන බවත් මම විශ්වාස කරමි. ප්‍රබල පක්ෂ දෙකක් නිර්මාණය කිරීමේ ශක්තිය ලාංකික ජාතියට ඇත. ජාතිය ගොඩනැගීම සඳහා මෙම පක්ෂ දෙක මේ ශක්තිය උපයෝගීකර ගතයුතු යයි මම විශ්වාස කරමි."

ගරු විපක්ෂනායකතුමනි,

එදා දෙසැම්බර් 22 වෙනිදා මා කළ එම ප්‍රකාශය යළිත් ඔබතුමාට සිහිපත් කිරීමට මම කැමැත්තෙමි.

ගරු කථානායකතුමනි,

ඔබතුමා මෙම ගරු සභාවේ උත්තරීතර කථානායක තනතුරට තෝරා

ගැනීමේ දී දෙපක්ෂයේ ම මන්ත්‍රීවරුන් මුළු පිරූ ඒ නව දේශපාලන සංස්කෘතිය තවදුරටත් ශක්තිමත් කොට ඉදිරියට ගෙන යෑම අපගේ කාර්යභාරය යි. ජාතිය ඉදිරියේ ඇති බරපතළ ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා අප සියලු වාද භේද ඉවතලා එක්සත් වෙමු. අප සියලුදෙනා එකමුතු වී මේ ත්‍රස්තවාදයේ හා මරණයේ සංස්කෘතිය ඉවත දමමු. සාමය සඳහා වන අපේ ඉතාමත් ප්‍රබුද්ධවූත්, අත්‍යාවශ්‍යවූත්, බෙහෙවින් හදිසිවූත් කාර්යය සපුරා ගැනීම සඳහා පටු ආකල්ප, වෙනස්කම්, ඊර්ෂ්‍යා, කුඩුකෝඩුකම් හා සියලු වාදබේද පසෙකලා එක්වන්නැයි මෙම ගරු සභාවේ සිටින සියලුම පාර්ශ්වවලට අයත් ගරු මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි,

කලට වැසි වසින සරු පොළවක් තිබෙන, ලෝකයේ ප්‍රධානම ආගම් සියල්ලක්ම අදහන, ගුණගරුක මිනිසුන් වෙසෙන මේ මනරම් දිවයින නැවතත් සමෘද්ධිය හා සෞභාග්‍ය කරා ගෙන යෑමට අවශ්‍ය ශුභ වාතාවරණය සැකසී තිබේ. ඔබ මේ ලද අවස්ථාව අපේ උදාර මව්බිමට සේවය කිරීම සඳහා උපරිම ලෙස යොදා ගන්නැයි මා මේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි. ඔබේ සහයෝගය, ඵලදායී විවේචනය සහ පුරෝගාමී මැදිහත්වීම, අපේ රට වැසියා උණුසුම් හදින් අපේක්ෂා කරන බව නිසැකය.

ශ්‍රේෂ්ඨත්වයේ හිනි පෙත්තට ම නැගීම සඳහා පුද්ගලයෙකුට හෝ ජාතියකට ඉතිහාසය හිමි කර දෙන්නේ විරල අවස්ථා කිහිපයක් පමණි. අපි බොහෝ අවස්ථා අත්හැර දමා ඇත්තෙමු. මෙම අරමුණු මුදුන් පමුණුවා ගැනීමට අපට දැන් උදාවී ඇති මේ සාරවත් සහ අවසාන අවස්ථාව නැවත වරක් අත්හැර දැමිය නො හැකි ය. එය අත්හැර නො දැමිය යුතු ය.

අප යෝජනා කර ඇති සාකච්ඡාමය දේශපාලන විසඳුම මගින් ලබා ගතහැකි සදාකාලික සාමය සඳහා වූ අපේ අභිප්‍රාය මුදුන් පමුණුවා ගැනීම සඳහා මනා රාජතාන්ත්‍රිකභාවය සහ නිර්භීතභාවය අපට තිබිය යුතුය.

එසේම නව ජාතියක් ගොඩ නැගීමට අපි නිරන්තරයෙන් හා නො පසුබස්නා උත්සාහයෙන් එකමුතුව කටයුතු කළයුතු වෙමු. කුමන ජාතියකට, කුමන ආගමකට හෝ කුලයකට අයත් වුවද, අප සියලුදෙනා ම එක්ව සතුටින් ජීවත්වීමට එක්සත් හා ශක්තිමත් දේශයක් අප ගොඩනගා ගත යුතු ය. අපේ විවිධත්වයේ සුවිශේෂ වූ ශාන්තිය උකහා ගනිමින් එක ම ජාතියක් ගොඩ නගමු.

ඔබ සැමට සියලු ජය පතමි.

මෙතෙක් වේලා මට සවන්දීම පිළිබඳව ගරු කථානායකතුමනි, ඔබ තුමාට ද මේ ගරු සභාවට ද මාගේ ස්තුතිය පුද කර සිටිමි.

REFERENCE



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

Printed at the Department of Government Printing, Sri Lanka.